# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/109/2024 (PSC)**

එස්.යූ.බී.දවුන්ඩසේකර
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
**වගඋත්තරකරු**

**දිනය :-2026.05.20**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක එස්.යූ.බී.දවුන්දසේකර,
අභියාචක වෙනුවෙන් රජයේ සේවක, ඩී.ආර්.ඩී.යූ.දිසානායක මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ටී.රේවතී මිය.

**-නියෝගය-**

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශයේ පරිගණක වැඩ සටහන් සම්පාදක/ පද්ධති විශ්ලේෂක III ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස 1999.07.01 දින රාජ්‍ය සේවයට එක්වී ඇත. එම අවස්ථාවේ පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව, වසර දෙකක් තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හා වසර අටක් තුළ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. අභියාචක දක්වා සිටින පරිදි 2006.07.01 දිනට පෙර II කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු වුවත්, අභියාචක අදාළ විභාගය සමත් වී ඇත්තේ, 2021.11.01 දිනය. විභාගය පැවැත්වූ පළමු අවස්ථාවේ දීම ලකුණු 72ක් ලබා ගෙන විභාගය සමත් වූ බව දන්වා සිටී. ඒ අනුව අභියාචක තමාගේ අහිමි වූ වැටුප් වර්ධක හා උසස්වීම් ලබා දෙන ලෙස ඉල්ලා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ 2023.10.23 දිනැති ඉල්ලීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත. එම තීරණයෙන් තෘප්තිමත් නොවූ

අභියාචක මෙම අධිකාරයට 2024.05.13 දින අභියාචනාවක් ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින්නේ,

"04. මා මාගේ අභියාචනයෙන් ඉල්ලා සිටින්නේ,

(i) II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය නොපැවැත්වීමත්, විනිවිද භාවයකින් යුක්තව නිසි ක්‍රමවේදයක් අනුව නියමිත ශාස්ත්‍රපති උපාධිය හැදෑරීමට වැඩ පිළිවෙලක් නොතිබීමත්, මා හට එක වරක් හෝ අදාළ ශාස්ත්‍රපති උපාධිය හැදෑරීමට අවස්ථාවක් ලබා නොදීමත්, මාගේ පාලනයෙන් තොර බැවින්ද, රාජ්‍ය පරිපාලන 06/2006 චක්‍ර ලේඛය අනුව සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය අනුව II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නියමිත කාලයට පෙර සමත්ව ඇති බැවින් ද, මාගේ වැටුප් වර්ධකය විලම්භනය කිරීම සම්පූර්ණයෙන්ම ඉවත් කර මාහට ලැබිය යුතු සියළුම වැටුප් වර්ධක හා උසස්වීම් ලබාදීමට නියෝගයක් ලබාදෙන ලෙස ඉල්ලමි. (2007.07.01 දින සිට 2014.01.16 දින දක්වා)

(ii) එසේ කිරීමේ දී යම් ගැටළුකාරී තත්ත්වයක් වේ නම්, 2012 වර්ෂයේ සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය නැවත වතාවක් සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව උපදෙස් ලබාදීම මාගේ වරදකින් සිදු නොවුවක් බැවින් 2012 වර්ෂයේ සිට පරිගණක වැඩ සටහන් සම්පාදක/පද්ධති විශ්ලේෂක III ශ්‍රේණියේ තනතුරකට අන්තර්ග්‍රහණය කලාසේ සළකා මා හටද 2012 වර්ෂයේ සිට වැටුප් වර්ධක හා උසස්වීම් ලබාදීමට නියෝගයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටීම.

මෙයට අමතරව අභියාචක 2025.05.19 දින ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබාදුන් නිරීක්ෂණ වලට ප්‍රති උත්තර ලෙස පැහැදිලි සාරාංශ ගත වාර්තාවක් මෙම අභියාචනයට ඉදිරිපත් කර සිටී. එමෙන්ම විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි.

මෙම අභියාචනය පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තමාගේ නිරීක්ෂණ 2024.09.19 දින හා 2026.05.06 දින මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත. එමෙන්ම විවෘත අධිකරණයේ දී වැඩිදුර පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2024.09.19 දින නිරීක්ෂණ වලට අනුව,

1. අභියාචක 1999.07.01 මෙම තනතුරට පත්ව ඇත.
2. අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුව වසර 02ක් තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම හා වසර 08කින් දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.
3. 2001.09.01 දිනට පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්ව ඇති අතර, 2007.07.01 ට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් නොවීම නිසා වැටුප් වර්ධක විලම්භනය වී ඇත.
4. දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා සුදුසුකම් ලෙස

i. පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති (MCC) උපාධියක් ලබා තිබීම.
ii. කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්වන පරිගණක පිළිබඳව කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීම.
iii. අදාළ නිලධාරීන් පරිගණක විද්‍යාව පිළිබඳව (MCC) උපාධියක් පත්වීම ලබන විට ලබා තිබීම මත කාර්යක්ෂමතා කඩඉම් දෙකෙන් නිදහස් කිරීම.

එසේ වුවත් මෙම අභියාචක මේ අතරින් එක සුදුසුකමක් හෝ අදාළ දිනට සපුරා නැත.

5. 2015.01.13 දින නව බඳවා ගැනීමේ පරිපාටිය හඳුන්වා දී ඇත. ඒ අනුව,
   i. පළමු කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය ඉවත්කර ඇත. ඒ වන විටද අභියාචක පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව ඇත.
   ii. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, II ශ්‍රේණියට පත්වී වසර 03 තුළ සම්පූර්ණ කළ යුතුය.
6. එසේ වුවද නව බඳවා ගැනීමේ පරිපාටියේ 14 වගන්තිය අනුව අභියාචක III ශ්‍රේණියේ වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සපුරා නැති බැවින් හා වැටුප් වර්ධක නියමිත පරිදි උපයා ගෙන නැති බැවින් III ශ්‍රේණියට නැවත අන්තර් ග්‍රහණය කර ඇත.
7. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2026.05.06 දින ලබාදෙන ලද නිරීක්ෂණ යටතේ වැඩි දුරටත් දන්වා සිටින්නේ, දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමට / නිදහස් කිරීමට ක්‍රම 03ක් හඳුන්වා දී තිබියදීත්, අභියාචක එක් ක්‍රමයක් මතද රඳා සිට ඇති බවයි.
8. ඕනෑම පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව පිළිබඳව (MCC) උපාධියක් ලබා ගත හැකි අතර, ඒ පිළිබඳව වැය වන මුදල අදාළ ආයතනය මගින් ලබාදෙනු ලබයි. එසේ වුවත් අදාළ දෙපාර්තමේන්තුවෙන් මෙම අධ්‍යායන කටයුතු සඳහා මුදල් ඉල්ලීම් කළ බවක් අනාවරණය නොවන බව වැඩිදුරටත් දන්වා සිටී. එය අභියාචකගේ දුර්වලතාවයකි.

අභියාචකගේ ලිඛිත දේශන වලින් ඔහු දක්වා සිටින්නේ, SOR බඳවා ගැනීමේ පරිපාටිය අනුව කොළඹ විශ්ව විද්‍යාලය මගින් අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය නොපැවැත්වීම නිසා තමාට එම අවස්ථාව ලබා ගැනීමට නොහැකි වූ බවයි. එය තමාගේ පාලනයෙන් තොර බවද දන්වා සිටී. එය සත්‍යයක් වුවද, අනිකුත් උපාය මාර්ග ගැනීමට කිසිදු උත්සාහයක් අභියාචක දරා නොතිබූ බවද

මෙහිදී බැහැර කිරීමට අපහසුය. තමාගේ පත්වීම් ලිපියේ පැවති කොන්දේසි අනුව සහ 2007 සිට 2021 දක්වා වසර ගණනාවක් කාර්යක්‍ෂමතා කඩඉම් පවත්වන තුරු බලා නොසිට සුදුසුකම් සපුරා ගැනීමට පියවරක් ගැනීම ඔහුගේ වගකීම වේ. අදාළ වගකීමෙන් අභියාචකට මඟ හැර යා නොහැකිය.

අභියාචක දන්වා සිටින පරිදි අදාළ නව බඳවා ගැනීම් පරිපාටියේ අන්තර්ග්‍රහණය කිරීමේ යම් අඩුපාඩු පවතින බව සහ අන්තර් කාලයක් සඳහන් නොවීම ආදිය දන්වා සිටී. එසේ වුවත් අඩුම තරමින් තමාගේ වෘත්තීය තත්වය වැඩි දියුණු කර ගැනීම සඳහා යම් ඉල්ලීමක් හෝ අභියාචක සිදුකළ යුතුව තිබුණි. එවැනි කිසිදු ඉල්ලීමක් සිදු කරනු ලැබූ බවක් දක්නට නැත. 2021 වසරේ කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත් වීමෙන් පසුව අදාළ සියළු සහන ඉල්ලා සිටීම පමණක් නිදහසට කරුණු ලෙස පිළිගැනීමට අපහසුය. ඉහත සියළු කරුණු කෙරේ අවධානය යොමු කිරීමෙන් අනතුරුව අභියාචක ඉල්ලා සිටින පරිදි, අදාළ සුදුසුකම් නියමිත දිනට සපුරා නොමැති බැවින් සහ එම සුදුසුකම් සපුරා ගැනීමට යම් උත්සාහයක් හෝ දරා ඇති බවට සාක්ෂි නොමැති බැවින්, ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු. මෙම තීරණය අභියාචක, සහ ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-